**ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 08 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 13,397.22 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 13,198.16 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 199.06 ක් හෙවත් සියයට 1.49 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 2,848.87 | 2,821.11 | 27.76 | 0.97 |
| මූලධන | 10,548.35 | 10,377.05 | 171.30 | 1.62 |
| **එකතුව** | **13,397.22** | **13,198.16** | **199.06** | **1.49** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ 2 ක් හා දෙපාර්තමේන්තු 4 ක් විසින් එකතුව රු.මිලියන 2,545 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,504 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,041 ක් හෙවත් සියයට 40.90 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 143.78 | 137.37 | 115.00 | 136.84 | 500.00 | 356.86 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ පොදු තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 556.29 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0022/000 | 13.15 |
| 6000/0000/00/0001/0041/000 | 3.24 |
| 6000/0000/00/0016/0008/000 | 258.12 |
| 6000/0000/00/0018/0010/000 | 279.92 |
| 6000/0000/00/0013/0036/000 | 1.86 |
| **එකතුව** | **556.29** |

**2.4 විගණන නිරීක්ෂණය**

**------------------------**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**---------------------------------------------------**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**--------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**3.2 විගණන සාක්ෂි නොවීම**

**----------------------------**

වාර්තා කර ඇති පරිදි දෙපාර්තමේන්තුවට අදාළ මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ රු.711,312 ක් වටිනා ගෙවීම් වවුචර් 02 ක් අස්ථානගත වී තිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

**------------------**

**3.3.1 අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කිරීම සඳහා ප්‍රමාණවත් අග්‍රිමයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම වැය විෂයයන් 14 හි ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ක සිට සියයට 61 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ආ)** සංවර්ධන වැඩසටහන් යටතේ වැය විෂයන් 05 කට සලසා තිබුණු රු.340,000,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි. ක්‍රියාත්මක කළ නොහැකි ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසා ගෙන ඒවා වෙනත් ව්‍යාපෘතිවලට මාරු කර තිබුණි.

**3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

**------------------------------------------------------------------------------------------**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් රු.675,812,469 ක් හෙවත් සියයට 60 ක්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලද රු.353,768,084 ක් හෙවත් සියයට 26 ක්, වනජීවී සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද රු.4,110,630 ක් හෙවත් සියයට 94 ක්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙන් ලද රු.3,199,477 ක් හෙවත් සියයට 33.5 ක් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලද රු.4,020,150 ක් හෙවත් සියයට 100 ක් අදාළ කාර්යය ඉටුකරගැනීමට භාවිතා නොකිරීම හේතු කොට ගෙන ඉතිරි වී තිබුණි.

**3.4** **පොදු තැන්පත් ගිණුම**

**-------------------------**

වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු. 39,904,408 ක්වූ තැන්පතු 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

------------------------------------------------------------------------

විෂය අංක 28201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 14,995,956 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**(ආ)** සමාජික ණය ලේඛනවල දැක්වෙන කේවල ශේෂවල වටිනාකම සහ සැසඳුම් ප්‍රකාශය සමග ඉදිරිපත් කළ කේවළ ශේෂවල වටිනාකම අතර රු.977,250 ක වෙනසක් පැවැතුණි.

**(ඇ)** 2014 වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවලදී විශ්‍රාම ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.345,414 ක් වූ ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි**.**

**3.6** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

------------------------

2015 දෙසැම්බර් 31 දිනට ස්ථිර කාර්යය මණ්ඩලය 6,029 කින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමන්විත වී තිබුණි. ප්‍රධාන කාර්යාලය හා දිවයින පුරා විසිරුණු කළාප කාර්යාල 14 කින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කර තිබුණි. දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබුණු නීති, රීති හා රෙගුලාසිවලට අනුව අභ්‍යන්තර පාලනක්‍රම සහ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන විවිධ ව්‍යාපෘතිවල ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කාර්යභාරය ඉටු කිරීමට නිලධාරීන් 19 දෙනෙකු අනුමත කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට තනතුරු 08 ක් පුරප්පාඩුවී තිබුණි. තවද අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩලයේ ඵලදායීතාවය වර්ධනය කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් පුහුණුවීම් ලබාදීමටද දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.7** **වත්කම් කළමනාකරණය**

**-----------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** දෙපාර්තමේන්තුව සතුව තිබෙන නිල නිවාස 39 ක් නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා විනාශ වී තිබුණි. තවද නිල නිවාස 118 ක් අබලන්ව පැවතීම නිසා සහ පදිංචියට නිලධාරීන් ඉදිරිපත් නොවීම හේතු කොටගෙන දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවැතුණි.

**(ii)** පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අයත් තුවක්කු 27 ක් එස්.ජී. පතරොම් 83 ක් හා රයිපල් 272 ක් වසර 25 කට වැඩි කාලයක් මුළුල්ලේ භාවිතයට ගෙන නොතිබුණු අතර ඒවා අපහරණය කිරීමටද කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

දෙපාර්තමේන්තුව සතු නිල නිවාස අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

**(i)** දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 16 ක අනවසර පුද්ගලයින් පදිංචිව සිටින බව හඳුනාගෙන තිබුණද, ඔවුන්ව ඉවත්කිරීමට නිත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

**(ii)** රජයේ දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත නිල නිවාස 42 ක් අවිධිමත්ව ලබාදී තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-------------------------------------------------------------------

වෙනත් ආයතනවලින් ලැබී තිබුණු වාහන 10 ක් විධිමත් අනුමැතියකින් තොරව අනුරාධපුර කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය සහ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල විසින් භාවිතයට ගෙන තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

-----------------------------

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට වඩා අඩු කාලයක සිට පැවැත එන රු. මිලියන 2,342.76 ක බැරකම් පැවැතුණි. මුදල් රෙගුලාසි 94(1) විධිවිධාන ප්‍රකාරව වැය විෂයයන් 19 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 2,060.33 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

-------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XII වැනි පරිච්ඡේදයේ 1 වගන්තිය | අනුරාධපුර කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරීවරයා 2015 වර්ෂයේදී අනුමැතියකින් තොරව දින 130 ක් සේවයට වාර්තා කර නොතිබුණි. එම කාලය නිවාඩු දිනයන් ලෙස නිවාඩු ලේඛනයේද සටහන් කර නොතිබුණි. තවද එම ගණකාධිකාරීවරයා දින 100 කදී පැමිණීම අත්සන් කර තිබුණත්, බැහැරයාමකින් තොරව පිටවීම අත්සන් කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 | අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සිදුවී තිබුණු වාහන අනතුරු 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අසාමාන්‍ය ලෙස ප්‍රමාද කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 262 | අක්කරෙයිපත්තුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය චෙක්පත් ලිවීමකින් තොරව 2015 දෙසැම්බර් 30 දින ගෙවීම් වවුචර් 20 ක් මුදල් පොතේ සටහන්කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 316 | අක්කරෙයිපත්තුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය සතු මුදල් ආරක්ෂිත සේප්පුවක නොදමා විෂයභාර කළමනාකරණ සහකාරවරයාගේ මේස ලාච්චුවේ අනාරක්ෂිතව තබාගෙන තිබුණි. |

## 3.9 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කළ යුතුව තිබුණත්, එම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|
| | රු. | |
| පෙතියාගොඩ ජල පොම්පාගාරය ඉදි කිරිම | 50,000,000 | අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීමට නොහැකිවිම. |
| ඇල්ලපොතාන අමුණ | 25,000,000 | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් වී නොතිබීම. |
| ඇල්ලේ වැව ජලාශය | 30,000,000 | නැවත පදිංචි කිරීමේ සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු පැවැතිම. |
| රුගම් - කිතුල් ජලාශය | 60,000,000 | ඉඩම් ගැටළු හා තාක්ෂණික ගැටළු පැවැතීම |

### (ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2015 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| දෙඹරආර පෝෂිත ඇල ඉදිකිරීම | 31,635,771 | 2010 | 18,406,471 | ඉදිරිපත් කර නැත |
| තලකොල වැව පුනරුත්ථාපනය කිරීම | 2,685,354 | 2011.12.21 | 2,059,773 | ඉදිරිපත් කර නැත |

**3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල නොකිරීම**

2015 වර්ෂයට අදාළව කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 06 ක බැංකු ගිණුම් 07 ක් වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

අනුරාධපුරය හා අම්පාර කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

**3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් මතබේදාත්මක ගනුදෙනු අනාවරණය විය.

(අ) ගබඩා භාරකරුවකුගේ 2002 වර්ෂයට පෙර සේවා කාලයේදී සිදුවී තිබුණු මිණුම් උපකරණ ඌණතාවයේ වටිනාකම රු.4,313,239 ක් ලෙස වාර්තා කර තිබුණි. එම නිලධාරියා ජල ශක්ති අංශයේ සේවය කර 2002 මැයි 09 දින අනිවාර්ය විශ්‍රාම ගන්වා තිබුණි. මෙම ඌනතාවය සම්බන්ධයෙන් පවරන ලද නඩුවේ තීන්දුව අනුව රු.411,051 ක් පමණක් එම නිලධාරියාගෙන් අයකරගෙන තිබුණි. 2015 අගෝස්තු 31 දින වන විටත් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි. වසර 13 කට පෙර සිදුවී තිබුණු මෙම ඌනතාවය අයකර ගැනීම සඳහා නිසි පසුවිපරමක් සිදු කර නොතිබුණි. තවද ඌනතාවය අයකර ගැනිමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.

**3.12 අවිධිමත් ගනුදෙනු**

**අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත වාරිමාර්ග දෙපාර්තමේන්තුවට බඳවාගෙන තිබුණු සේවකයින් යැයි ප්‍රකාශ කරමින් 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර සේවකයින් 1,755 දෙනෙකුට ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම සේවකයින් 1,755 කින් 230 දෙනෙක් විවිධ හේතූන්මත තනතුරුවලින් ඉවත්වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට සේවයේ නිරතව සිටින එලෙස බඳවා ගෙන තිබුණු සේවකයින් 1,525 ක් විය. එම සේවකයින් සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) උක්ත චක්‍රලේඛයේ පළමු ඡේදය ප්‍රකාරව ස්ථිර පත්වීම් ප්‍රදානයකළ යුත්තේ දෙපාර්තමේන්තුවට බඳවාගෙන ඒ වන විටත් සේවයේ යෙදී සිටින සේවකයන්ට වුවද විධිමත් පත්වීම් ලිපි මගින් සේවයට බඳවාගෙන සිටි බවට සනාථ නොවූ සේවකයින්ද ස්ථිර කර තිබුණි. ඉන් වැඩි පිරිසක් තදුචිත පදනම මත (ad hoc) සේවයේ යොදවාගෙන තිබුණු අය වූ බැවින් ඉහත චක්‍රලේඛයෙන්

එම සේවකයින් බඳවා ගැනීම ආවරණය නොවන බව ඔවුන් සේවයේ ස්ථිර කළ නොහැකි බවත් නිරීක්ෂණය විය.

(ආ) ඉහත චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව 2014 ඔක්තෝබර් 24 දිනට අඛණ්ඩව දින 180 ක සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු සේවකයින් 16 දෙනෙකුට එම අඩුපාඩුව නොසලකා ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණු බව නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) 2013 ජනවාරි 30 දිනැති අංක 03/2013 (පාලන 04) දරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව බඳවා ගනු ලබන සියලුම තදුවිත සේවකයන් උපරිම මාස 05 ක් සේවයේ යොදවාගෙන සේවා බණ්ඩනයක් සිදු කර තිබුණි. එවැනි සේවකයන්ට උක්ත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව අඛණ්ඩ සේවා කාලයක් පැවතිසේ සලකා ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි.

**3.13 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

-----------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) ව්‍යාජ පත්වීම්**

-----------------

අම්පාර සහ මඩකලපුව වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයන්හි ගබඩා සහකාර හා කම්කරු තනතුරු 15 කට පත්වීම් ප්‍රදානය කිරීමට අදාළව නිකුත් කර තිබූ පත්වීම් ලිපිවල දැක්වෙන අත්සන් හිටපු වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සන හා නොසැසඳෙන බවත් දෙපාර්තමේත්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් මෙවැනි පත්වීම් පිරිනැමීමක් සිදුකර නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ) ස්ථිර පත්වීම් ප්‍රදානය සඳහා කූඨ ලේඛන සැකසීම**

-------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් පමණක් ස්ථිර කළ යුතු වුවද, හිරියාල, නාච්චාදුව, වාරියපොල, ඉගිණිමිටිය සහ මහනුවර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයන්හි සහ කොළඹ ප්‍රධාන කාර්යාලයේ නියමිත දින ගණන සම්පූර්ණ නොකළ සේවකයින් 04 දෙනෙකු වෙත ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. මේ සඳහා ව්‍යාජ තොරතුරු ඇතුළත් අයදුම්පත්, චර්යා සටහන් පත් පිළියෙල කිරීම හා ව්‍යාජ වෛද්‍ය වාර්තා, රෝග විනිශ්චය තුන්ඩු පිළියෙළ කර තිබූ අවස්ථා නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

**(ii)** සේවය කළ දින ගණන, ගෙවූ වැටුප, චෙක්රෝල් අංකය වැනි තොරතුරු ව්‍යාජව ඇතුළත් කර චර්යා සටහන් හා අයදුම්පත් පිළියෙළ කර දෙපාර්තමේන්තුව තුළ එක් දිනක් හෝ සේවය කර නොමැති සේවකයින් 07 දෙනෙකුට පදවිය හා හිරියාල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල සහ කොළඹ ප්‍රධාන කාර්යාලයේ සේවා ස්ථිර කර තිබුණු බව නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

**(iii)** ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ආසියානු සංවර්ධන බැංකු ආධාර මත පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද (දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ) වියලි කළාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ තාක්ෂණික වැඩ පරීක්ෂකවරයෙකු ලෙස සේවකයෙකුට මාස 06 ක කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ව්‍යාපෘති අරමුදලින් වැටුප් ගෙවා තිබුණි. එම සේවකයා දෙපාර්තමේන්තු සේවකයෙකු බවට ව්‍යාජ පත්වීම් ලිපියක් සකස් කර 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක තනතුරේ සේවා ස්ථිරත්වය ප්‍රදානය කර තිබුණි.

## 3.14 පාඩු හා හානි

2015 දෙසැම්බර් 31 දිනට මුදල් වංචා අවස්ථාවන් තුනකින් රු.301,908 ක් තවදුරටත් අයකර ගැනීමට තිබුණි. ඉන් රු.261,777 ක්වූ වංචාවන් 02 ක් සිදුවී වර්ෂ 19 ක් හා වර්ෂ 36 ක කාලයක් ගතවී තිබුණි. 2014 වර්ෂයේ සිදුවූ මුදල් වංචාවකින් තවදුරටත් රු.40,131 ක් අයකර ගැනීමට තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.15 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් අක්‍රමිකතාවයන් හා ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | |
|---|---|---|
| **වර්ෂය** | ඡේද අංකය | **යොමු ගත විෂයය** |
| 2006 | 3.1 (අ) | සුගලා දේව්වැව ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු සහකාරවරයෙකු සිදුකර ඇති අක්‍රමිකතා. |
| 2006 | 7.2 (අ) | වෙහෙරගල ව්‍යාපෘතිය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් ලබා ගැනීම. |

## 3.16 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනත සහ වරින්වර එයට සිදුකර ඇති සංශෝධන වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**(ආ)** 2013 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව ගැලපීමෙන් පසුව එම ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව නිවැරදි සංවිධාන සටහනක් පිළියෙල කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ සිවිල් හා යාන්ත්‍රික අධ්‍යක්ෂක තනතුරු 42 ක් සඳහා ඒ එක් එක් තනතුරට අදාළව රාජකාරී ලැයිස්තු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.525,000,000 ක්වූ ප්‍රතිපාදන සලසා තිබුණද, ඊට අදාළ ශාක්‍යතා අධ්‍යයනයක් හා පාරිසරික අධ්‍යයනයක් සිදුකර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 39 ක් නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා විනාශ වී තිබුණි. නිල නිවාස 42 ක් හමුදාව, පොලිසිය සහ වෙනත් ආයතනවල කාර්යාල පිහිටුවා තිබුණු අතර ඒවා නිරවුල් කරගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. තවද ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 09 කට අයත් නිල නිවාස 16 ක් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි.

(ඉ) වාරිමාර්ග ඇලක් කැඩීයාමෙන් ඇති වූ ගංවතුර ගැලීම හේතුවෙන් කැඩුණු නිවසක් වෙනුවට අම්පාර වීරගොඩ ප්‍රදේශයේ නිල නිවාසයක් ගොවි මහතෙකුට ලබාදී තිබුණු අතර එම නිල නිවාසය නැවත අත්පත් කරගෙන නොතිබුණි.

(ඊ) වෙනත් ආයතනවලින් ලැබී තිබුණු වාහන 10 ක් අනුරාධපුර කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය සහ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය භාවිතා කළද එම වාහන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) අනුරාධපුර වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන ලේඛනගත කිරීමට ලේඛනයක් සකස් කර නොතිබුණු අතර වාහන නඩත්තු කිරීමේ ලිපිගොනු යාවත්කාලීන කර නොතිබුණි. මාසික ධාවන සටහන් අසම්පූර්ණව පිළියෙල කර තිබුණු අතර ඒවා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) දෙබරආර පෝෂිත ඇල ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකු සමග රු.31,635,771 ක්වූ ගිවිසුම් 9 කට එළඹ තිබුණි. නමුත් එම ඉදිකිරීම් කටයුතු 2015 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ අත්තිකාරම් මුදලින් රු.2,749,000 ක් ආපසු අයකර ගත යුතුව තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. අදාළ ඉදිකිරීම්වල ගණනය කළ වටිනාකම වූ රු.18,406,471 ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(එ) තලකොලවැව පුනරුත්ථාපනය කිරීම සඳහා 2011 දෙසැම්බර් 21 දින පෞද්ගලික ආයතනයක් සමග රු.2,685,354 ක ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.2,059,773 ක් වූ වැඩ කොටස් පමණක් නිමකර තිබුණු අතර සම්පූර්ණ කාර්ය නිම කිරීමට 2016 ජූනි 30 දින වන විටත් දෙපාර්තමේන්තුවට හැකි වී නොතිබුණි.

(ඒ) මීටර් 946 ක් දිග කිඹුල්ඔබේ වාරිමාර්ග පාර දියුණු කිරීම සඳහා එක් ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකියාව තිබියදී ඇස්තමේන්තු දෙකක් පිළියෙළ කර තිබුණි. දිග මීටර් 30 ක ප්‍රමාණයක් ඇස්තමේන්තු දෙකෙහි ඇතුළත් කර තිබීම හේතුවෙන් ඇස්තමේන්තුගත වියදම රු.52,439 කින් වැඩිවී තිබුණි. වැඩ ආරම්භ කිරීමට පෙර ඇස්තමේන්තුව සකස් කළ යුතු වුවත්, 2015 ජූනි මාසයේදී ඉහත ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර තිබුණද, ඇස්තමේන්තුව සකස් කිරීම 2015 සැප්තැම්බර් මාසය දක්වා ප්‍රමාද කර තිබුණි. ඇස්තමේන්තුවට අනුව මතුපිට පස් මීටර් 4.76 ක ප්‍රමාණයක පස් ඉවත් කළ යුතු වුවද, මීටර් 04 ක ප්‍රමාණයක පමණක් පස් ඉවත්කර තිබුණි. තවද ඇස්තමේන්තුව අනුව මාර්ගයේ පළල මීටර් 8 ක් වුවත් ක්ෂේත්‍රය පරීක්ෂාවට අනුව මාර්ගයේ සාමාන්‍ය පළල මීටර් 7 ට වඩා අඩුවී තිබුණි.

(ක) ගලමුණ අමුණ ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුගේ අනුමත කිරීමේ සීමාව වූ රු.2,000,000 ක් ඉක්මවා රු.2,695,000 ක ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

(ග) පල්ලයඩියාන් දකුණු පස ගංවතුර බැසීම නිසා සෝදාගිය මීටර් 139 ක්වූ කොටස් අලුත්වැඩියා කිරීමේ ඇස්තමේන්තුව සැකසීමේදී මීටර් 9 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. මෙම ඇස්තමේන්තුගත වටිනාකම රු.750,000 ක්වූ අනුඥාත කර තිබුණත්, අදාළ සැලැසුම් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය විසින් අනුමත කර නොතිබුණි. මෙම කාර්යය සඳහා මාස 09 ක කාලයක් ගත කර තිබුණු අතර විගණන අවස්ථාව වන විට යෙදූ පස් බොහෝමයක් සේදී ගොස් තිබුණි. මාර්ගයට යෙදූ පස් තදකර නොතිබුණු අතර ප්‍රමිතියෙන් තොර වැලි සහිත පස් පාරට දමා තිබුණි.

**3.17 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

--------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 6,453 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 5,417 ක් බව සඳහන් කර තිබුණද, සේවක වර්ග අනුව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1036 ක් වී තිබුණි. 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් විගණනයේදි නිරීක්ෂණය විය.

**(ii)** බඳවා ගෙන තිබුණු 612 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(iii)** 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ස්ථිර පත්වීම් ලබාදුන් සේවක සංඛ්‍යාව 1,686 ක් බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට වාර්තා කර තිබුණුද, 2016 ජුනි මාසයේදී විගණනයට ලබාදුන් වාර්තාවේ බඳවාගත් සේවක සංඛ්‍යාව 1,755 ක් බව දක්වා තිබුණි. 2016 ජූනි 30 දින වන විටද, මෙම සේවක සංඛ්‍යාව දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඇතැම් සේවකයින් ඉදිරිපත් කරන ලද සාවද්‍ය තොරතුරු සත්‍ය බව නිලධාරීන් විසින් සනාථ කිරීම හේතුවෙන් සුදුසුකම් නොලත් සේවකයින්ටද ස්ථිර පත්වීම් ලබාදී තිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

--------------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් 2016 අප්‍රේල් 05 දිනැති අංක IEN/A/SA/16/15 දරන ලිපියෙන් ඉල්ලා සිටියද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉල්ලීමට පිළිතුරු ලබාදී නොතිබුණි. එහෙත් 2014 දෙසැම්බර් 31 දින වනවිට දෙපාර්තමේන්තුවේ සේවකයින් 09 දෙනෙකු අවිධිමත් ලෙස බාහිර ආයතනවලට මුදා හැර තිබුණි.